(අනෙකුත් රාජ්‍ය/අර්ධ රාජ්‍ය නිලධාරීන්/බාහිර අයදුම්කරුවන් සඳහා) අවසන් දිනය – 2025.11.20

# ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන **"වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතියේ (PAEHP)"** පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) මාර්ග ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ම කොළඹ ස්ථාපිත කර ඇත.

මෙම පත්වීම් 2019.03.05 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධානවලට යටත් වනු ඇත

**ව්‍යාපෘතියේ නම – වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතිය**
**(ඇමරිකානු ඩොලර් මිලියන 250ට වැඩි කාණ්ඩය)**

| අංකය | තනතුරු නාමය | කළ.සේ. චක්‍රලේඛ අංක 01/2019 අනුව PS/වැටුප් කාණ්ඩය | පුරප්පාඩු ගණන |
|---|---|---|---|
| 01 | ප්‍රසම්පාදන විශේෂඥ | PS -03 | 01 |

**යථෝක්ත කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019 අනුව, PS-03 කාණ්ඩයේ (ඇමරිකානු ඩොලර් මිලියන 250ට වැඩි කාණ්ඩය) මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත.**

## 1.ප්‍රසම්පාදන විශේෂඥ (PS 03)

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද [පහත (1) හෝ (2) හෝ (3)]**

1.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්

හෝ

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

- අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අනුබද්ධ සාමාජිකත්වය/ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්

සමග

- එම සුදුසුකම් ලැබීමෙන් පසුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 14ක පළපුරුද්ද

2.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්

හෝ

- අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

- අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අනුබද්ධ සාමාජිකත්වය හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්

සහ

- අදාළක්ෂේත්‍රයේපිළිගත්වෘත්තීයආයතනයකින්ලබාගත්සමායත/වරලත්සාමාජිකත්වයහෝඒහාස මානවෘත්තීයසුදුසුකමක් හෝ අදාළක්ෂේත්‍රයේපශ්චාත්උපාධියක්

සමග

- එම සුදුසුකම් ලැබීමෙන් පසුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10ක පළපුරුද්ද

3.

- රජයේ දීප ව්‍යාප්ත සේවාවල I පන්තියේ හෝ එයට සමාන තත්ත්වයක අදාළ ක්ෂේත්‍රයේ සිටින රජයේ නිලධාරියෙකු වීම

සමග

- I පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 05ක පළපුරුද්ද

<u>සාමාන්‍ය කොන්දේසි :</u>

- බඳවා ගැනීම, වැටුප, ප්‍රතිලාභ සහ අනෙකුත් සේවා කොන්දේසි 2019.03.05 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 හි දක්වා ඇති විධිවිධාන ප්‍රකාර වේ.
- තෝරා ගැනීම්, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ අනෙකුත් චක්‍රලේඛමය කොන්දේසි මත පදනම් වේ.
- මෙම චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතියට අනුව සියලුම අයදුම්පත් සම්පූර්ණ කර, අදාළ ලේඛනවල සියලුම පිටපත් සමග එවිය යුතු ය.
- එක් තනතුරකට වඩා වැඩි ගණනකට අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙන ම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.
- තෝරාගනු ලැබුවහොත් අපේක්ෂකයින් දිවයිනේ සහ/හෝ ප්‍රදේශයේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට එකඟ විය යුතු ය.
- ව්‍යාපෘති කාර්යාලය, 1 වන මහල, චෛත්‍ය පාර, කොළඹ 01 යන ස්ථානයේ පිහිටා ඇත.

**01. වයස් සීමාව:**

| | | |
|---|---|---|
| අනෙකුත් රාජ්‍ය නිලධාරින් | - | අවුරුදු 60 |
| බාහිර අයදුම්කරුවන් | - | අවුරුදු 64 |

**02. වැටුප:**

මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 අනුව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

**03. සේවා නියුක්ති කොන්දේසි:**

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත ප්‍රථමයෙන් වසරක කාලයක් සඳහා ය. සේවා අවශ්‍යතාව සහ කාර්ය සාධනය මත පදනම්ව දිගුවක් සඳහා සලකා බැලිය හැකි ය.

- අයදුම්කරු දැනටමත් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක ස්ථිර තනතුරක් දරන්නේ නම් මෙම පත්වීම නිත්‍ය තනතුරේ පත්කිරීම් බලධරයා විසින් නිර්දේශ කරනු ලබන කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි 2.3.3 ඡේදයේ සඳහන් මුදාහැරීමේ පදනම සහ යථා පරිදි මුදාහැරීම මත පදනම් වනු ඇත.

- අයදුම්පත් නිසි පරිදි පුරවා නැති සහ අයදුම් පත සමග නිවැරදි දත්ත සපයා නැති සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි දක්වා ඇති අනෙකුත් අවශ්‍යතා සහ සුදුසුකම් සපුරා නැති අයදුම්කරුවන් පත්වීම් සඳහා සලකා නොබැලේ.

- පත්වීම් ප්‍රදානය කිරීමේ හෝ නොකිරීමේ තීරණය චක්‍රලේඛ සහ අනෙකුත් විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අභිමතය පරිදි සිදු කෙරේ.

**04. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක දැනටමත් ස්ථිර තනතුරක් දරන අයදුම්කරුවෙකු තම අයදුම්පත් කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි 2.3.3 ඡේදයට අනුව නිත්‍ය තනතුරෙන් මුදා හැරීමේ සහතිකය සහ මුදාහැරීමේ පදනමේ නිර්දේශය ද සහිතව සිය ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය. (එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)

**05. අයදුම්පත යොමු කිරීම**

නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහතින් දී ඇති ආකෘතිය අනුව පුරවා අධ්‍යාපන සුදුසුකම්, සේවා පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු ද සමග ආයතන ප්‍රධානියා හරහා එම නිර්දේශය ද සමග (අදාළ නම්) 2025.11.20 දිනට හෝ එදිනට පෙර **ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය, මගනැගුම මහමැදුර, අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ පාලන අංශයට අතින් ගෙනවිත් භාර දිය හැකි ය. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ නිවේදනයේ දැක්වෙන ආකාරයට තනතුරේ සහ ව්‍යාපෘතියේ නම සඳහන්කරන්න.

**06. විශේෂ අවධානය සඳහා**

- **දී ඇති ආකෘතියට අනුකූලව නිසි පරිදි පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- **තෝරා ගැනීම සඳහා සලකා බලනුයේ අයදුම්පත සමග සහතිකවල පිටපත් ඉදිරිපත් කළ සුදුසුකම් පමණි.**

**07. වැඩිදුර විමසීම් සඳහා කරුණාකර පහත දුරකථන අංකය අමතන්න.**
0112887472

**08. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවැනි අවස්ථාවක සිංහල නිවේදනයේ භාෂා පාඨය බලපැවැත් වේ.**

අයදුම්පත් ආකෘතිය - ඇමුණුම 1

**ලේකම්**
**ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය**

අයදුම්කරන තනතුර

ඇමුණුම 1
කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

# අයදුම් පත්‍රය
## (PS කාණ්ඩයේ තනතුරු සඳහා)

මහාමාර්ග අමාත්‍යාංශයේ ..................................... ව්‍යාපෘතියේ ........................................... තනතුර සඳහා අයදුම් පත්‍රය

**(………………………………………………………… ව්‍යාපෘතිය)**

1) අයදුම් කරන තනතුර ……………………………………………………………………..
(තනතුරු එකකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුරට වෙන වෙන ම අයදුම් පත් ඉදිරිපත් කළ යුතු ය)

2) මුලකුරු සමග නම (සිංහලෙන්)

……………………………………………………………………………… මයා/මිය/මෙනවිය

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) Mr./ Mrs. / Miss:
……………………………………………………………………………………………

3) මුලකුරුවලින් හැඳින්වෙන නම
(සිංහලෙන්)………..…………………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
…………………..…………………………………………………………………

4) ජාතිය: ………………………………..

5) ස්ත්‍රී-පුරුෂ භාවය: ……………………………………

6) ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

7) උපන් දිනය:

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

8) වයස:
(අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

9) පදිංචිය පිළිබඳ විස්තරය:

| ලිපිනය<br>………………………………………………………....<br>…………………………………………………………<br>…………………………………………………………… | |
|---|---|
| ස්ථාවර දුරකථන අංකය | |
| ජංගම දුරකථන අංකය | |
| විද්‍යුත් ලිපිනය | |

කාර්යාලයීය විස්තර : (වත්මන් සේවා ස්ථානය)

| ලිපිනය<br>……………….………………………………………......<br>..…………………………………………………………<br>…………………………………………………………….. | |
|---|---|
| ස්ථාවර දුරකථන අංකය | |
| ෆැක්ස් අංකය | |
| විද්‍යුත් ලිපිනය | |

10) අධ්‍යාපන සුදුසුකම්:

| අංකය | පාඨමාලාවේ නම | උපාධිය/පශ්චාත් උපාධිය/පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ඩිප්ලෝමාව | විෂය/අදාළ ක්ෂේත්‍රය | වලංගු දිනය | විශ්වවිද්‍යාලය/පුහුණු ආයතනය |
|---|---|---|---|---|---|
| 01 | | | | | |
| 02 | | | | | |
| 03 | | | | | |

11) වෘත්තීය සුදුසුකම්:

| අංකය | වෘත්තීය සුදුසුකම | වලංගු දිනය | ආයතනය | NVQ මට්ටම |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |
| 03 | | | | |

12) අදාළ වන පුහුණු:

| පුහුණුවේ නම | ආයතනය | කාල සීමාව | අදාළ ක්ෂේත්‍රය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

13) මාර්ග සංවර්ධන අධිකාරියේ පළපුරුද්ද:

| තනතුර | වගකීම් | වර්ෂ ගණන |
|---|---|---|
| | | |
| | | |
| | | |

14) නිත්‍ය තනතුරෙන් පූර්ව මුදා හැරීම් ඇත්නම් ඒ පිළිබඳ විස්තර:

| ව්‍යාපෘතියේ/ආයතනයේ නම | දැරූ තනතුර | කාල සීමාව (සිට-දක්වා) | වර්ෂ ගණන | මුදා හැරීම් පදනම | | |
|---|---|---|---|---|---|---|
| | | | | පූර්ණ කාලීනව (වැටුප් සහිතව) | පූර්ණ කාලීනව (වැටුප් රහිතව) | වැඩ බලන |
| | | | | | | |
| | | | | | | |

15) පළපුරුද්ද සම්බන්ධයෙන් සහතික/ලිපි (ඡායාස්ථ පිටපත් අමුණන්න)

I. ……………………………………………….
II. ……………………………………………….
III. ……………………………………………….

**16) අයදුම්කරුගේ සහතිකය**

මා විසින් අයදුම්පත් කැඳවීමේ නිවේදනය කියවන ලද අතර, මෙම අයදුම්පත සඳහා වන සියලුම තොරතුරු අවබෝධ කර ගත් බව සහතික කරමි. මාහට විරුද්ධව අධිකරණමය කටයුත්තක් නොමැති අතර, මවිසින් මෙම අයදුම්පතට සපයා ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට සහතික වෙමි. මවිසින් සපයා ඇති තොරතුරු අසත්‍ය බවට තහවුරු වුවහොත් මෙම තනතුරට නුසුදුස්සෙක් වන බව ද, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019හි දක්වා ඇති කොන්දේසි සහ නියමයන් හා බැඳී සිටින බව ද දනිමි.

දිනය: ……………………………….

……………..……………………………..
අයදුම්කරුගේ අත්සන

**ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බවත්, මෙම අයදුම්පත ඉදිරිපත් කරන.................................................මහතා/මහත්මිය/මෙනවිය (අයදුම්කරුගේ නම)..............................(නිත්‍ය තනතුර) වශයෙන් සේවය කරන බවත්, ඔහු/ඇයට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව සහ විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් කර හෝ නොමැති බව ද මෙයින් සහතික කරමි.

| ව්‍යාපෘතියේ/ආයතනයේ නම | දැරූ තනතුර | කාලය සිට-දක්වා | වර්ෂ ගණන | මුදාහැරීමේ පදනම | | |
|---|---|---|---|---|---|---|
| | | | | පූර්ණ කාලීනව (වැටුප් සහිත) | පූර්ණ කාලීනව (වැටුප් රහිත) | වැඩ බලන |
| | | | | | | |
| | | | | | | |

එමෙන් ම, ඔහුගේ/ඇයගේ නිත්‍ය තනතුරෙන් කලින් සිදු කළ මුදාහැරීම් පිළිබඳ විස්තර ඔහුගේ/ඇයගේ පුද්ගලික ලිපිගොනුව අනුව ඉහත වගුවේ දක්වා ඇති අතර, ඒ බව තහවුරු කරමි. ඉහත තොරතුරු සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 විධිවිධාන සලකා බලා, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ නිත්‍ය තනතුරෙන් මුදා හැරිය හැකි බව ද, ..................................................(තවදුරටත් මුදාහරින කාලය) සඳහා එකී චක්‍රලේඛයේ සඳහන් 2.3.3. අ/2.3.3 ආ/2.3.3 ඇ ඡේද ප්‍රකාරව මුදා හැරිය හැකි බව සහ මුදා හැරීමට එකඟවන බව ද ප්‍රකාශ කරමි.

දිනය: …………………………………

……………………………………………………

ආයතන ප්‍රධානියාගේඅත්සන සහ මුද්‍රාව